00778

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU5550- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. මනෝවිද්‍යාව විෂයය ඇසුරෙන් බිහි වූ විවිධ ක්ෂේත්‍ර පවතී. අධ්‍යාපන මනෝවිද්‍යාව එවැනි එක් විෂයය ක්ෂේත්‍රයකි. අධ්‍යාපන මනෝවිද්‍යාව හා සම්බන්ධතාවක් දක්වන වෙනත් මනෝවිද්‍යා විෂයය ක්ෂේත්‍ර පහක් (05) නම් කරන්න.

02. වර්ධනය සංවර්ධනය අතර වෙනස උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

03. (i) සහභාගිත්ව නිරීක්ෂණය (Participatory Observation) යන්න පැහැදිලි කරන්න.

    (ii) සිසුන්ව නිරීක්ෂණය සඳහා සහභාගිත්ව නිරීක්ෂණය භාවිතා කිරීමේ දුෂ්කරතා දෙකක් (02) සාකච්ඡා කරන්න.

04. "එක් එක් පුද්ගලයා වෙත සංවර්ධන අවධි එළඹෙන්නේ එකම වයසේ දී නොවේ." මෙම අදහස උදාහරණ ඉදිරිපත් කරමින් සාධාරණීකරණය කරන්න.

05. ශිෂ්‍ය අවධානය පවත්වාගෙනයාම සඳහා ගුරුවරයෙකුට ගත හැකි උපායමාර්ග පහක් (05) ලියන්න.

06. චිත්තවේගික නොසන්සුන්තාවන් නිසා සිසුන් තුළින් දැකිය හැකි හැසිරීම් තුනක් (03) පැහැදිලි කරන්න.

07. (i) පෙළඹවීම යන්න නිර්වචනයක් ඇසුරුකරගෙන සාකච්ඡා කරන්න.

    (ii) පෙළඹවීම පිළිබඳ ප්‍රවේශ තුනක් (03) නම් කරන්න.

08. 'සංජානනය පහසු කරන්නේ අවධානය මඟිනි' උදාහරණ සපයමින් මෙම අදහස සාධාරණීකරණය කරන්න.

ලකුණු 05 X 08 =40



03

## 02 - වන කොටස

09. I. අධ්‍යාපන මනෝවිද්‍යාව හැදෑරීම නිසා ගුරුවරයෙකු ලෙස ඔබගේ චර්යාවේ සිදු වූ ධනාත්මක වෙනස්කම් පහක් (05) පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 10 )

II. ඔබ ඉහත සඳහන් කරන ලද ධනාත්මක වෙනස්කම් දරුවන්ගේ ඉගෙනුම් සුසාධ්‍යකරණය සඳහා භාවිත කරගන්නා ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

10. I. "ළමයින්ගේ සංවර්ධනය කෙරෙහි වන ආරමය බලපෑම් වෙනස් කිරීම අපහසුය." උදාහරණ සපයමින් මෙම අදහස සාධාරණීකරණය කරන්න. (ලකුණු 06 )

II. ළමා සංවර්ධනය කෙරෙහි පරිසරය බලපාන ආකාරය පවුල සහ පාසල යන සාධක දෙක (02) යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 )

III. ළමයින්ගේ සංවර්ධනයට සුදුසු පරිසරයක් නිවෙස තුළ ඇති කිරීමට දෙමාපියන්ට දිය යුතු උපදෙස් පත්‍රිකාවක් පිළියෙළ කරන්න. (ලකුණු 08 )

11. I. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දරුවන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ අධ්‍යයන වල දී පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රමවල වැදගත්කම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 )

II. තොරතුරු රැස්කරගැනීමේ ක්‍රම ලෙස සම්මුඛ පරීක්ෂණ හා ප්‍රශ්නාවලි, සංසන්දනාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු 06 )

III. "ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් පිළිබඳ ව තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියට වඩා සම්මුඛ පරීක්ෂණ යෝග්‍ය වේ." මේ පිළිබඳ ව ඔබගේ මතය තර්කානුකූල ව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 08 )

12. I. "තැත්වරද ක්‍රමය සිසුන්ගේ අපේක්ෂිත ඉගෙනුම් අරමුණු වෙත ළඟා වීමේ දී ඉතා වැදගත් ඉගෙනුම් උපායමාර්ගයකි." මෙම ප්‍රකාශය නිදසුන් ඇසුරින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 )

II. සිසුන්ගේ ඉගෙනුම් උපායමාර්ග පිළිබඳ ව ගුරුවරුන් ඉතා හොඳ අධ්‍යාපනික හා ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීමේ වැදගත්කම තර්කානුකූල ව සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

13. I. ඉගෙනීම කෙරෙහි දරුවාගේ පරිණතභාවය බලපාන ආකාරය පිළිබඳ ව ගුරුවරයෙකු දැනුවත්වීමේ වැදගත්කම උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. දරුවෙකු පරිණත මට්ටම සහ ඔවුන්ට ලබා දී ඇති ඉගෙනුම් කාර්යයන් අතර අසමතුලිතතාවයන් ඇති වූ විට එය ඔවුන්ගේ අධ්‍යයන කාර්යයන් සඳහා බලපාන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*